# 5 ශ්‍රේණිය සිංහල

# පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු

# 06 ඒකකය - 2022



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1



# 6 මල් සිරි සිරි සිසිරි සිසිරි

රාජ්‍ය සාහිත්‍ය සම්මානය හිමි වූ **සෙනසුරාගෙ අපල කාලෙ** නම් වූ ළමා සාහිත්‍ය කෘතිය ජයරත්න සමරසේකර මහතාගේ නිර්මාණයකි. එය රචනා වී ඇත්තේ සීයා කෙනකු ළමයින්ට කතාන්දරයක් කියා දෙන ආකාරයට ය. කවි සංවාද ඇසුරෙන් කතාව ඉදිරිපත් කෙරෙන මෙහි ප්‍රධාන චරිතය වන්නේ වස්තුහාමි නම් ගමරාල යි.



(සිතුවම:- ජයරත්න සමරසේකර)

කාර්යශූර ගොවියකු වූ වස්තුහාමි ධනවත් පුද්ගලයෙකි. දිනක් නැකැත්රාල කෙනෙක්, වස්තුහාමිට ඉදිරියේ දී අයහපත් කාලයක් උදා වන බව පවසයි. එය අසා කම්පාවට පත් වූ වස්තුහාමි කිසිදු කාර්යයක නිරත නොවී අලසව සිටීම නිසා ඔහුගේ වගා බිම් ආදිය විනාශ වී යයි. ඒ හේතුවෙන් ඔහුගේ ධනය පිරිහෙයි.

වස්තුහාමිගේ මිතුරකු වන නරිනයිදේ කෙනෙක් ඔහුගේ මේ වෙනස දකී. මිතුරු නරිනයිදේ වස්තුහාමිට පවසන්නේ අයහපත් කාලය ගැන නොසිතා වෙහෙස වී වැඩකටයුතු කිරීම සුදුසු බවයි. ඒ අදහස පිළිගත් වස්තුහාමි යළිත් පෙර පරිදි ම වෙහෙස වී වගා කටයුතු හොඳින් සිදු කර ධනවතකු බවට පත් වෙයි. වස්තුහාමිගේ උත්සාහය නිසා යළිත් එළ දරා සරුසාර වුණු ගොවි බිම්වල චමත්කාරය පහත පැදි පෙළෙන් නිරූපණය වේ. අලසකම දුරු කොට උත්සාහයෙන් හා වෙහෙස වී වැඩකටයුතු කළ හොත් ජීවිතය ජය ගත හැකි බව මෙම පාඩමෙන් කියවේ.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

වස්තුහාමි: මල් සිරි සිරි
සිසිරි සිසිරි
මල් වරුසා වහින්නේ

කුඹුර කලල් කර ගන්ඩයි
මේ මල් වැහි වහින්නේ


ඒ මල් වැස්සේ තෙමි තෙමි
පැළපත රැළි නඟනවාය
බණ්ඩි ඇදී කිරට හැරී
කරල් බිමට නැවෙනවා ය

ඉර අහසේ ඔමරි පපා
හිනා කැරලි හෙළන්නේ
ජයට සැදී කිරි කුරහන්
පීදෙන හැටි බලන්නේ

මෑ - මුං - තල - අමු - මෙනේරි
හිනැහෙන කොට අත වන වන
මගේ සතුට නළියනවා
හිත ඇතුළේ උඩ පැන පැන

තක්කිට තරිකිට තරිකිට
ගෙයි අටු කොටු පිරෙයි පිරෙයි
වක්කඩ කැඩුවා විලසට
සතුට දෝර ගලයි ගලයි

සීයා: වස්තුහාමි ගමරාලගෙ
අටු කොටු ඉතිරෙන වස්තුව
නිධානෙකින් ලැබිල නෙමෙයි
දෙයියො ගෙනත් දීල නෙවෙයි




නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ගම මැද්දෙන්
හොර හිතකින්
සඟවා ගෙන ගෙනත් නෙමෙයි

සිනා සිසී සීදේවිය
ගේ තුළ සැරිසරන්නේ
සිනා කැකුළු මල් ඉහිරී
මිදුලට අතු නැමෙන්නේ

යලට මහට වැඩ කෙරුවා
ඇඟපත දහඩිය හෙළුවා
අස්වනු අටු කොටු පිරිලා
වස්තුව ගේ තුළ පිරුණා



**නරි නයිදේ:** කලට යලට වැඩ කෙරුවොත්
කුසීතකම දුරු කෙරුවොත්
නුවණ කල්පනා කෙරුවොත්
නෑ වරදිනු කවදාවත්


නොමිලේ බෙදා හැරීම සඳහා ය.



රාජ්‍ය සාහිත්‍ය සම්මානය හිමි වූ මෙම ළමා සාහිත්‍ය කෘතිය රචනා වී ඇත්තේ සීයා කෙනකු ළමයින්ට කතාන්දරයක් කියා දෙන ආකාරයට ය. කවි සංවාද ඇසුරෙන් කතාව ඉදිරිපත් කෙරෙන මෙහි ප්‍රධාන චරිතය වන්නේ වස්තුහාමි නම් ගමරාල යි.

කෘතිය - ........................................................................

රචනය - ........................................................................

- **අවබෝධය**

1. මල් වැහි වහින්නේ කුමක් සඳහා ද?

........................................................................................................

2. හිනා කැරලි හෙළන්නේ කවුරුන් ද?

........................................................................................................

3. සතුට දෝරේ ගලන ආකාරය කවියේ දක්වා ඇත්තේ කෙසේ ද?

........................................................................................................

........................................................................................................

4. වස්තුහාමි ගමරාලට අටු කොටු ඉතිරෙන්න වස්තුව ලැබුණේ කෙසේ ද?

........................................................................................................

5. මෙහි සඳහන් ධාන්‍ය වර්ග මොනවා ද?

........................................................................................................

- **ක්‍රියාකාරකම්**

1. සමාන තේරුම් දෙන වචන කවි පන්තියෙන් සොයා ලියන්න.

I. කෙත - ........................ II. සූර්යයා - ........................

III. කම්මැළි - ........................ IV. ඥානය - ........................

V. ප්‍රීතිය - ........................

2. සුදුසු ක්‍රියා පදය වරහන් තුළින් තෝරන්න.

i. මල් වැහි ................................ (වසියි/ වසිති)

ii. කිරි කුරහන් ........................... (පීදෙයි/ පීදෙති)

iii. ගෙයි අටු කොටු ...................... (පිරෙයි/ පිරෙති)

iv. සතුට දෝරේ .......................... (ගලයි/ ගලති)

v. මිදුලට අතු ............................. (නැමෙයි/ නැමෙති)

- **පැවරුම්**

1. මේ පද්‍ය පන්තිය ගායනා කරන්න.

2. මේ පද්‍ය පන්තියෙහි එක ම වචනය එක ළඟ දෙවරක් යෙදුණු අවස්ථා මොනවා ද?
උදා : සිරි සිරි

.................................................................................................

.................................................................................................

3. අරුත් පැහැදිලි කිරීම ලියන්න.

I. කලල් කර ගන්ඩ

.................................................................................................

II. පැළපත

.................................................................................................

III. බණ්ඩි ඇදී

.................................................................................................

IV. වක්කඩ

.................................................................................................


V. ඔමරි පාන

.................................................................................................

VI. යලට මහට

.................................................................................................

.................................................................................................



"ගින්න බල සම්පන්න ය; ජලය ගින්නට වඩා බලසම්පන්න ය; පෘථිවිය ජලයට වඩා බල සම්පන්න ය; මිනිසා ඒ සියල්ලට ම වඩා බලසම්පන්න ය"

තරු මඟ - වයි ගගාරින්
පරිවර්තනය: ඊ. ආර්. එරත්න

(තරු මග, ප්‍රථම අභ්‍යවකාශ යාත්‍රිකයා වූ යූරි ගගාරින්ගේ ජීවිත කතාව හා ඔහුගේ වීර ගගන චාරිකාව පිළිබඳ විස්තරයකි.)




........................

........................

# පිළිතුරු



Answer



රාජ්‍ය සාහිත්‍ය සම්මානය හිමි වූ මෙම ළමා සාහිත්‍ය කෘතිය රචනා වී ඇත්තේ සීයා කෙනකු ළමයින්ට කතාන්දරයක් කියා දෙන ආකාරයට ය. කවි සංවාද ඇසුරෙන් කතාව ඉදිරිපත් කෙරෙන මෙහි ප්‍රධාන චරිතය වන්නේ වස්තුහාමි නම් ගමරාල යි.

කෘතිය - ...සෙනසුරාගෙ අපල කාලෙ....................................
රචනය - ...ජයරත්න සමරසේකර මහතා..............................

- **අවබෝධය**

1. මල් වැහි වහින්නේ කුමක් සඳහා ද?

...කුඹුර කලල් කර ගන්ඩ.......................................................................

2. හිනා කැරලි හෙළන්නේ කවුරුන් ද?

...ඉර.......................................................................................

3. සතුට දෝරේ ගලන ආකාරය කවියේ දක්වා ඇත්තේ කෙසේ ද?

...චක්කඩ කැඩුවා විලසට.......................................................................
...සතුට දෝර ගලයි ගලයි.......................................................................

4. වස්තුහාමි ගමරාලට අටු කොටු ඉතිරෙන්න වස්තුව ලැබුණේ කෙසේ ද?

...අලසකම දුරු කොට උත්සාහයෙන් හා වෙහෙස වී වැඩකටයුතු කළ නිසා

5. මෙහි සඳහන් ධාන්‍ය වර්ග මොනවා ද?

...මෑ - මුං - තල - අමු - මෙනේරි.......................................................................

- **ක්‍රියාකාරකම්**

1. සමාන තේරුම් දෙන වචන කවි පන්තියෙන් සොයා ලියන්න.

I. කෙත - ...කුඹුර........... II. සූර්යයා - ...ඉර...............
III. කම්මැළි - ...කුසීත.......... IV. ඥානය - ...නුවණ..........
V. ප්‍රීතිය - ...සතුට...........

2. සුදුසු ක්‍රියා පදය වරහන් තුළින් තෝරන්න.

i. මල් වැහි ...............වසියි........... (වසියි/ වසිති)
ii. කිරි කුරහන් ............පීදෙයි......... (පීදෙයි/ පීදෙති)
iii. ගෙයි අටු කොටු ...පිරෙයි........ (පිරෙයි/ පිරෙති)
iv. සතුට දෝරේ .........ගලයි.......... (ගලයි/ ගලති)
v. මිදුලට අතු ...........නැවෙයි...... (නැමෙයි/ නැමෙති)

- **පැවරුම්**

1. මේ පද්‍ය පන්තිය ගායනා කරන්න.

2. මේ පද්‍ය පන්තියෙහි එක ම වචනය එක ළඟ දෙවරක් යෙදුණු අවස්ථා මොනවා ද?
උදා : සිරි සිරි

සිසිරි සිසිරි, තෙමී තෙමී, වන වන, පැන පැන, තරිකිට තරිකිට

පිරෙයි පිරෙයි, ගලයි ගලයි

3. අරුත් පැහැදිලි කිරීම ලියන්න.

I. කලල් කර ගන්ඩ

මඩ කර ගන්න

II. පැළපත

පැළ ගොයම

III. බණ්ඩි ඇදී

පිදී ගෙන එන/ බඩක් මෙන් මතු පිටට හෝ ඉදිරියට නෙරූ

IV. වක්කඩ

කුඹුරක වැඩි ජලය බැස යාමට නියරෙහි කපන කපොල්ල

V. ඔමරි පාන

අඟුර දඟුර පෑම/ඉඟි බිඟි පෑම/උසුළු විසුළු පෑම

VI. යලට මහට

ශ්‍රී ලංකාවේ ගොවිතැන් කරන ප්‍රධාන කාල පරිච්ඡේද දෙක

යල කන්නය හා මහ කන්නය

"ගින්න බල සම්පන්න ය; ජලය ගින්නට වඩා බලසම්පන්න ය; පෘථිවිය ජලයට වඩා බල සම්පන්න ය; මිනිසා ඒ සියල්ලට ම වඩා බලසම්පන්න ය"

තරු මඟ - වයි ගගාරින්
පරිවර්තනය: ඊ. ආර්. එරත්න

(තරු මග, ප්‍රථම අභ්‍යවකාශ යාත්‍රිකයා වූ යූරි ගගාරින්ගේ ජීවිත කතාව හා ඔහුගේ වීර ගගන චාරිකාව පිළිබඳ විස්තරයකි.)



යූරි
ගගාරින්



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

**අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.**

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.**

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

**එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ**